THE NATIONAL
PHOTOGRAPHIC ART SOCIETY
OF SRI LANKA

Approved Charity, Govt. Gaz. No. 442/20/87
Incorporated Company Reg. No G.A. 300

P.O. Box. 452, Colombo, Sri Lanka.
Office: 170, Kolonnawa Road, Dematagoda,
Colombo 09, Sri Lanka.

Web: www.npasslanka.org
email: npas@sltnet.lk

# ඡායාරූප පාඨමාලා විද්‍යාර්ථයින් සඳහා වන මාසික ඡායාරූප තරඟ නිර්ණායක

## අරමුණ

සංගමයේ ඡායාරූප පංතිවල අධ්‍යාපනය ලබන විද්‍යාර්ථයින්ගේ නිර්මාණාත්මක හැකියාව සහ රසවින්දනය වැඩිදියුණු කරලීම අරභයා මාසිකව සංවිධානය කෙරේ. ජාතික හා ජාත්‍යන්තර තරඟ සහ ප්‍රදර්ශන සඳහා නිර්මාණකරුවන් දිරිගැන්වීම ද මෙමගින් අපේක්ෂිත ය.

## තේමාව

සංගමයේ විද්‍යාර්ථයින් වෙනුවෙන් වාර්ෂිකව වැඩමුළු හතරක් පැවැත්වේ. ඒවානම් විහාරමහාදේවී වැඩමුළුව, කැළණි විහාර වැඩමුළුව, සත්ව උද්‍යාන වැඩමුළුව සහ මීගමු වෙරළ ආශ්‍රිත වැඩමුළුවයි. මෙම වැඩමුළු හතරේදී ලබාගත් ඡායාරූප වෙනුවෙන් ඒ ඒ වැඩමුළුවට අදාලව මාස හතරක දී විශේෂ මාසික තරඟ හතරක් පැවැත්වේ. එම එක් එක් වැඩමුළුවට අදාල මාසික තරඟ සඳහා ඉදිරිපත් කල හැක්කේ අදාල වැඩමුළුවේ දී ලබාගත් ඡායාරූප පමණි.

අනෙකුත් සියලු මාසික තරඟයක්ම විවෘත තේමා යටතේ පැවැත්වේ.

## නිර්මාණ ඉදිරිපත් කිරීම

සංගමයේ ඡායාරූප පන්තිවල අධ්‍යාපනය ලබන අයට පමණක් සීමා වේ.

## මාසික තරඟ වලට අදාල පොදු කරුණු

මාසික තරඟ සියල්ලම ඒක වර්ණ අංශය සහ වර්ණ අංශය යන අංශ දෙකකින් සමන්විත ය.

මාසික තරඟ සඳහා ඉදිරිපත් කරන සියලු ඡායාරූප මුද්‍රණය කර ඉදිරිපත් කල යුතු ය.

සෑම වසරකම පවත්වනු ලබන වැඩමුළු හතරේ ඒ ඒ වැඩමුළුවට අදාල මාසික තරඟයේ සමස්ථ ඒක වර්ණ ප්‍රථම ස්ථානය දිනාගන්නා සාමාජික-යාට සංගමයෙන් පිරිනැමෙන විශේෂිත සම්මාන හතරක් ප්‍රදානය කෙරේ.

- විහාරමහාදේවි උද්‍යාන ඡායාරූප තරඟය – බී. පී වීරවර්ධන ශූරතා පළිහ
- කැළණි විහාර ඡායාරූප තරඟය – එල්. බී. එස්. එස් බාලසූරිය ශූරතාවය
- දෙහිවල සත්වෝද්‍යාන ඡායාරූප තරඟය – විල්සන් හෑගොඩ ශූරතාව
- මීගමු වෙරළ ඡායාරූප තරඟය – වෛද්‍ය එම්. එස් වීරකෝන් ශූරතාව

ඉහත වැඩමුළුවලට අදාල මාසික තරඟ හතර පැවැත්වෙන දිනයන් මාසික තරඟ සංවිධායකවරයා විසින් දැනුවත් කෙරේ.

මීට අමතරව ඉහත වැඩමුළුවලට අදාල මාසික තරඟ හතර හැර වසරේ අනෙකුත් මාසික තරඟ සියල්ලෙහි ඉහලම දක්ෂතාවය පෙන්වන සාමාජිකයාට සමස්ත මාසික තරඟ ශූරතාව පිරිනැමේ.

මාසික තරඟ සඳහා ඉදිරිපත් කරනු ලබන සියලු ඡායාරූප නැවත ලබා දේ. මාසික තරඟ වලින් ජයග්‍රහණ ලැබූ ඡායාරූප නැවත ලබා දුන් පසු ඒවා සුරක්ෂිතව ගොනුවක බහා තැන්පත් කළ යුතු ය. වසර තුනේම වර්ෂ අවසාන වලදී පැවැත්වෙන විභාග වල සම්මුඛ පරීක්ෂණ වලදී මේවා ඉදිරිපත් කළ යුතු ය.

## මාසික තරඟ කොන්දේසි සහ උපදෙස්

එක් අයෙකුට අභිමත නිර්මාණ සංඛ්‍යාවක් ඉදිරිපත් කළ හැකි ය.

මීට පෙර ජාතික හෝ ජාත්‍යන්තර මට්ටමින් ප්‍රදර්ශිත හෝ ජයග්‍රහණ ලැබූ ඡායාරූප හෝ කලින් මාසික තරඟ වලට ඉදිරිපත් කරන ලද ඡායාරූප මේ සඳහා ඉදිරිපත් කළ නොහැකි අතර යම් හෙයකින් එවැනි ඡායාරූප ඉදිරිපත් කළහොත් තරඟයෙන් ඉවත් කරනු ලැබේ.

THE NATIONAL
PHOTOGRAPHIC ART SOCIETY
OF SRI LANKA

Approved Charity, Govt. Gaz. No. 442/20/87
Incorporated Company Reg. No G.A. 300

P.O. Box. 452, Colombo, Sri Lanka.
Office: 170, Kolonnawa Road, Dematagoda,
Colombo 09, Sri Lanka.

Web: www.npasslanka.org
email: npas@sltnet.lk

විවෘත තේමා යටතේ පැවැත්වෙන මාසික තරඟ වලට ඉදිරිපත් කෙරෙන ඡායාරූප වල පරිගණක මෘදුකාංග ඇසුරෙන් ඕනෑම සංස්කරණයක් සිදුකළ හැක. ඡායාරූප කීපයක් එක් කොට තනි ඡායාරූපයක් නිර්මාණය කරන්නේ නම් තමන් ඒ සඳහා භාවිතා කරන සියලුම ඡායාරූප තමන් විසින් ගනු ලැබූ ඒවා විය යුතු ය. කිසිදු අයුරකින් වත් ඡායාරූප නිර්මාණය කිරීම සඳහා අන්තර්ජාලය හෝ වෙනත් මූලාශ්‍ර වලින් ලබා ගත් ඡායාරූප භාවිත නොකල යුතු ය. ඡායාරූපයක් එවැනි සත්‍යතාව පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය වුවහොත් මුල්ගොනු (Raw Files) ඉදිරිපත් කළ යුතු ය.

විහාරමහාදේවි උද්‍යාන, කැළණි විහාර, දෙහිවල සත්වෝද්‍යාන සහ මීගමු වෙරළ යන වැඩමුළු හතරට අදාල මාසික තරඟ සඳහා ඉදිරිපත් කෙරෙන ඡායාරූප වල,

- සමස්ත ඡායාරූපයේ නිවැරදි වර්ණ කළමනාකරණය (Color Correction), දහනය කිරීම (Burning), මුවා කිරීම (Dodging), තියුණු කිරීම (Sharpning) හා කප්පාදු කිරීම (Cropping) අවශ්‍ය වන්නේ නම් පමණක් අවම වශයෙන් සිදු කළ හැකි ය.
- දූවිලි අංශුන් නිසාවෙන් ඇති වූ කුඩා තිත් ඉවත් කිරීම සිදු කළ හැකි වුව ද, කිසිදු ආකාරයකින් ඡායාරූපයේ කොටස් ඉවත් කිරීම හෝ කොටස් එකතු කිරීම සිදු කළ නොහැකි ය.

අධ්‍යයන වර්ෂයේ ප්‍රථම මාසික තරඟය සඳහා ඡායාරූප මුද්‍රණය කලයුතු විශාලත්වයන් පහත දැක්වේ.

ප්‍රථම වසර වර්ණ – විශාලත්වය 4” x 6”  සිට ඉහලට.

ප්‍රථම වසර එක වර්ණ<br>
දෙවන වසර වර්ණ<br>
දෙවන වසර එක වර්ණ<br>
තෙවන වසර වර්ණ<br>
තෙවන වසර එක වර්ණ

} විශාලත්වය 6” x 9”  සිට ඉහලට.

අධ්‍යයන වර්ෂයේ දෙවන මාසික තරඟයේ සිට අවසාන මාසික තරඟය දක්වා ඡායාරූප මුද්‍රණය කල යුත්තේ පහත සඳහන් විශාලත්වයට යි.

ප්‍රථම වසර වර්ණ<br>
ප්‍රථම වසර එක වර්ණ<br>
දෙවන වසර වර්ණ<br>
දෙවන වසර එක වර්ණ<br>
තෙවන වසර වර්ණ<br>
තෙවන වසර එක වර්ණ

} විශාලත්වය 6” x 9”  සිට ඉහලට.

තරඟයට ඉදිරිපත් කරන ඡායාරූප වෙනත් අයෙකු විසින් රූපගත කරනු ලැබූ හෝ අන්තර්ජාලයෙන් හෝ අන් කවර මූලාශ්‍රයකින් හෝ ලබාගත් ඒවා නොවිය යුතු ය.

සියලූ ඡායාරූප නොදිලිසෙන කඩදාසිවල (Matt Paper) මුද්‍රණය කළ යුතු ය.

තරඟය සඳහා ඉදිරිපත් කරනු ලබන ඡායාරූප වටා මුද්‍රිත, වර්ණ හෝ කලු සුදු බෝඩර් නොතැබිය යුතු අතර දිය සලකුණු, දින, අත්සන් හෝ නම සහිත ඡායාරූප මෙන්ම ලැමිනේට් කරන ලද මවුන්ට් කරන ලද හෝ රාමු කරන ලද ඡායාරූප ප්‍රතික්ෂේප කරනු ලැබේ.

තරඟය සඳහා ඉදිරිපත් කරන සියලු ඡායාරූප වල ඡායාරූප නරඹන දිශාවේ සිට පිටුපස හරවා පිටුපස දකුණු යටි කෙළවරේ පිළිවෙලින් තමන්ගේ නම, ඉගෙනුම ලබන වසර, සාමාජික අංකය, කෘතියේ මාතෘකාව සහ වරහන් තුල එය ඉදිරිපත් කරන්නේ වර්ණ අංශයටද ඒකවර්ණ අංශයටද යන්න පැහැදිළිව සටහන් කළ යුතු ය. (මෙම දත්ත සිංහලෙන් හෝ ඉංග්‍රීසියෙන් සඳහන් කළ හැක.)

උදා:

සමන් සිල්වා,<br>
ප්‍රථම වසර,<br>
16/6881<br>
මව් සෙනෙහස (ඒකවර්ණ)

Saman Silva,<br>
1st Year,<br>
16/6881<br>
Mother’s Love (Monochrome)




*මාසික තරඟ සම්බන්ධ ඕනෑම විමසීමක් සඳහා මාසික තරඟ සංවිධායකවරයා අමතන්න.